# ජනපද ගොවියකු ආදායම් ලබන හැටි

ශ්‍රී ලංකාවේ ජනපද යෝජනා ක්‍රම පහක විශේෂ අධ්‍යයනයක යෙදුණු පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරීන් දෙදෙනෙකු වන ඒ. එස්. රණතුංග සහ ඩබ්ලිව්. ඒ. ටී. අබේසේකර යන මහත් වරුන් විසින් මහකනදරාව ජනපදය අළලා පිළියෙළ කරන ලද වාර්තාවෙකින් උපුටා ගත් කොටස් මෙමු ලිපියට ඇතුළත් වෙයි. ජනපද ගොවියෙකු ගේ නිෂ්පාදන අලෙවි මාර්ග, ආදායම් තත්ත්වය ආදිය පිළිබඳව අවබෝධයක් මෙයින් ලබා ගත හැකි ය. (1976 මැයි සිට 1977 අප්‍රේල් දක්වා වූ වගා වර්ෂයට අදාළව යථොක්ත වාර්තාව සකස් කර ඇති බව සලකන්න).

මාස් කන්නයේ දී (1976/77) මහකනදරාව ජනපදයේ සාමාන්‍ය වී නිෂ්පාදනය ගොවිපළකට බුසල් 83 කි. යල් කන්නයේ දි ගොවිතැන් නොකරන නිසා මෙය ජනපදයේ වාර්ෂික වී නිෂ්පාදනය ලෙස ද දැක්විය හැක. ගොවීන් ගෙන් අඩක් ම බුසල් 26 ටත්, 75 ටත් අතර වී නිෂ්පාදනයක් වාර්තාකර තිබිණි. සාමාන්‍යයෙන් හය දෙනෙකු ගෙන් යුත් පවුලක ආහාර සඳහා පමණක් අවම වශයෙන් වසරකට වී බුසල් 60 ක් පමණ අවශ්‍ය වේ. පාරිභෝජන ප්‍රමාණයට වඩා වැඩියෙන් වී නිෂ්පාදනය කිරීමට හැකිව තිබුණේ ජනපදයේ ගොවි පවුල් වලින් අඩකට පමණි. කෙසේ වෙතත්, බීජ අවශ්‍ය තාවන් සහ වෙනත් ගෙවීම් ද සඳහා නිෂ්පාදනයෙන් කොටසක් වෙන් කළ පසු ස්වයං පෝෂිත මට්ටමේ සිටින ගොවීන් ගේ ප්‍රමාණය සියට 50 ටත් වඩා අඩුය. ගොවීන් ගෙන් සියට 80 ක් පමණ තම අස්වැන්නෙන් සුළු කොටසක් හෝ විකුණා තිබුනත් එම විකුණුම් හදිසි ගෘහ අවශ්‍යතා සඳහා මුදල් ලබා ගැනීමට 'සාගින්නේ සිට කළ විකුණුම්' බව මෙයින් පැහැදිලි වේ.

ජනපදයේ වී නිෂ්පාදනයෙන් සියට 37 ක් අලෙවි කර තිබුණු අතර, සියට 63 ක් ගෘහ පරිභෝජනය, බීජ අවශ්‍යතාවන්, වෙනත් ගෙවීම් ආදිය සඳහා යොද ගන්නා ලදී.

## සමූපකාරයේ අඩුපාඩු

පුද්ගලික වෙළෙඳුන් විසින් සුළු වශයෙන් කරන ලද වී මිල දී ගැණීම් හැරුණු විට වී මිල දී ගන්නා ප්‍රධාන ස්ථානය සමූපකාරය යි. මුළු වී විකුණුම් වලින් සියට 80 ක් ම සමූපකාර සමිති මගින් මිල දී ගන්නා ලදි. මිල දී ගන්නා ශාඛා සමිතිවල ගබඩා සහ අනිකුත් පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා සමූපකාරවලට අලෙවි කිරීමේ දි නොයෙකුත් අපහසුකම්වලට මුහුණ පෑමට සිදු වන බැවි ගොවිහු වැඩි දෙනෙක් ම සඳහන් කළහ. අප්‍රමාදව ගෙවීම් සඳහා මුදල් නොතිබීම සහ අයථා ක්‍රියාවන් ආදිය ද සමූපකාර පිළිබඳව ගොවීන් කළ අනිකුත් පැමිණිලි අතර වේ.

පුද්ගලික වෙළෙඳුන්ට වී අලෙවි කළ සියළු ම ගොවීන් වී බුසලකට ලැබූ මුදල සහතික මිලට (බුසල රු. 40.00) වඩා අඩු විය. බොහෝ අවස්ථා වල දී පුද්ගලික වෙළෙඳුන් ගොවිපලේ දී ම වී මිල දී ගැනීම නිසා ප්‍රවාහන ප්‍රශ්නයෙන් ගොවිහු නිදහස් වූහ. ගොවීන් පුද්ගලික වෙළෙඳුන්ට වී විකිණීමේ ප්‍රධාන හේතුවක් නම් මිල දී ගත් වී සඳහා අප්‍රමාදව මුදල් ගෙවීම ය. වර්ගය පිළිබඳව වෙළෙඳුන් වැඩි සැලැකිල්ලක් නොදැක්වීම ද තවත් හේතුවක් ලෙස සමහර ගොවීන් විසින් සඳහන් කර ඇත. එසේ වුව ද, පුද්ගලික වෙළෙඳුන්ට විකිණීමේ දි සිදු විය හැකි වංචනික ලෙස මැනීම වැනි අක්‍රමිකතාවන් ගොවීන් විසින් අවබෝධ කර ගෙන නැත.

අලෙවි කිරීම සඳහා ගොවි පොළෙහි ගබඩා කිරීමක් නොතිබුණු අතර, අලෙවි කළ හැකි වී ප්‍රමාණය අස්වැන්නෙන් පසුව වහාම විකුණා දමන බැව් පැහැදිලි විය. එසේ වුව ද, වෙනත් මූලික

වීරිභෝජන අවශ්‍යතා සඳහා 'නිවසේ තබා ගත් වී' පශේෂයෙන් යල් කන්නයේ දී සුළු ප්‍රමාණවලින් කඩ හිමියන්ට විකිණීම සාමාන්‍ය දෙයකි.

## වෙළෙඳුන්ට විකිණීම

ජනපදයේ නිපදවනු ලබන මාෂ බෝග වෙනත් ධාන්‍ය සහ එළවළු වර්ගද අලෙවි කිරීමේ මධ්‍යස්ථානය අසල පිහිටි නගරයයි. නගරයේ පුද්ගලික වෙළෙඳුන් මෙම ද්‍රව්‍ය මිල දී ගන්නා අතර පසුව ඒවා සැතපුම් අටක් ඈතින් පිහිටි ප්‍රධාන නගරය වන අනුරාධපුරයට ප්‍රවාහනය කරනු ලැබේ. මෙම නිෂ්පාදන මිල දී ගැනීම සඳහා රජයේ වැඩ පිළිවෙළක් දක්නට නොතිබිණි.

**වාර්ෂික බෝග සඳහා කලින් කලට තීරණය වන මිලෙන් ගොවීන් වාසි ලබා ගන්නා බවක් නොපෙනේ. ග්‍රාමීය මට්ටමින් මෙම බෝග වර්ග මිල දී ගැනීමේ වැඩ පිළිවෙළක් සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් නොමැතිවීම මෙයට ප්‍රධාන හේතුව ය.** මෙම හේතුවෙන් වාර්ෂික බෝග දැඩි මිල උච්චාවචනයකට ලක් වී ඇති බැව් පැහැදිලි වේ. මෙම අසතුටුදායක මිල වෙනස් වීම් ගොවීන් ගේ ආදායම් තත්ත්වය කැපී පෙනෙන ආකාරයෙන් පහත හෙළීමට හේතු වී ඇත. මේ අනුව, වී හැර අනෙකුත් ගොවි නිෂ්පාදන මිල දී ගැනීම සඳහා යෝග්‍ය ආයතනික උප ක්‍රමයක දැඩි අවශ්‍යතාව මනාව පැහැදිලි වේ.

ගොවිපලවල වාර්ෂික මුදල් ආදායම එක් එක් ප්‍රභවයන්ට වර්ග කළහොත් ගොවිපළකට කෘෂිකර්ම අංශයෙන් ලැබුණු සාමාන්‍ය මුදල් ආදායම පොදුවේ ගත් කළ මෙසේ ය:

## ගොවියා ගේ ආදායම් තත්වය

ජනපදයේ ගොවිපළක සාමාන්‍ය වාර්ෂික දළ ආදායම රුපියල් 7,200 ක් පමණ වන අතර, මුදලින් ලබා ගත් වාර්ෂික සාමාන්‍ය ආදායම රුපියල් 4,591 කි. වාර්ෂික සාමාන්‍ය මුදල් ආදායමින් සියට 19 ක් වී වලිනි. සියයට 16 ක් හේන් වගාවෙනි. හේන්වල ඉතා වැදගත් මුදල් බෝග අතර මිරිස්, තල, කව්පි, බඩ ඉරිඟු, ප්‍රධාන වේ. ගොඩ ඉඩම් වල වවන අඹ, මුරුංගා වැනි ස්ථිර බෝගයන් යල කන්නයේ දී ඉතා වැදගත් ආදායම් මාර්ගය වී ඇත. සත්ව පාලනයෙන් ගොවීන් විසින් ලබන ලද ආදායම සුළු වන අතර, මෙය ද ප්‍රධාන වශයෙන් උපයා ගනු ලබන්නේ මස් පිණිස හරකුන් විකිණීමෙනි.

කෙසේ වෙතත්, මහකනදරාව ජනපදයේ අඩුම ආදායම් ලබන ගොවීන් ගේ වාර්ෂික මුදල් ආදායම රුපියල් 1,000 ට අඩු අතර, වැඩිම ආදායම් ලබන්නවුන් ගේ වාර්ෂික මුදල් ආදායම රුපියල් 8,000 ටත්, 13,000 ටත් අතර වන බව ද සමීක්ෂණයේ දී හෙළි විය. ජනපද වාසී ගොවීන් අතුරෙන් පහෙන් කොටසක ගේ වාර්ෂික මුදල් ඉපැයුම රුපියල් 2, 000 ට අඩු ය. තවත් පහෙන් කොටසක ගේ ඉපැයුම් රුපියල් 2,000 ටත් 3,000 ටත් අතර ප්‍රමාණයෙකි.

| | 76 යල | 76/77 මහ | වාර්ෂික |
|---|---|---|---|
| කුඹුර (වී) | – | රු. 885 | රු. 885 |
| ගොඩ ඉඩම (අඹ, මුරුංගා ආදිය) | රු. 66 | රු. 442 | රු. 508 |
| හේන (මිරිස්, තල, කව්ය ආදිය) | රු. 217 | රු. 516 | රු. 733 |
| සත්ව පාලනය | රු. 209 | රු. 175 | රු. 384 |
| | රු. 492 | රු. 2018 | රු. 2510 |

## වී අලෙවි මණ්ඩලයේ මිලදී ගැනීම්

# නවත් ගබඩා සංකීර්ණ

ශ්‍රී ලංකාවේ ගොවීන්ගෙන් වී මිලදී ගන්නා ප්‍රධාන ආයතනය වන වී අලෙවි මණ්ඩලය මගින් 1980 ජනවාරි – මාර්තු කාලය තුළ මිලදී ගෙන තිබුණු වී ප්‍රමාණය (තාවකාලික දත්ත අනුව) බුසල් 41,84,000 කි. මණ්ඩලය සතුව 1980 මාර්තු අවසානය වන විට බුසල් 38 ලක්ෂයක (හාල් ටොන් 54,286 ක සමකයකි,) වී තොගයක් තිබිණි

පසුගිය වසරේ දී ජාතික වී නිෂ්පාදිතයෙන් සියට 29 ක් මණ්ඩලය මගින් මිල දී ගන්නා ලදී. මෙය 1978 දී මිල දී ගනු ලැබූ ප්‍රමාණයට වඩා සියට 21 කින් අඩු ප්‍රමාණයෙකි. 1978 දි මිල දි ගනු ලැබූ ප්‍රමාණය සියට 36 කි.

මණ්ඩලයේ මිල දී ගැනීම් අතුරෙන් සියට 88 ක් ම වියළි කලාපිය දිස්ත්‍රික්ක වලිනි. එසේ වුවද, පෞද්ගලික වෙළෙඳුන් වී සඳහා වැඩි මිලක් ගෙවීම නිසා වියළි කලාපයෙන් මණ්ඩලයට ලබා ගතහැකි වී ප්‍රමාණය අඩුවන්නට පටන් ගෙන තිබේ.

වී අලෙවි මණ්ඩලයේ වී මිල දි ගැනීම් පිළිබඳ විස්තරයක් මෙසේ ය.

වී අලෙවි මණ්ඩලය සතු ගබඩා කිරීමේ ධාරිතාවය 1978 අවසන් වන විට බුසල් දෙකෝටියක් පමණ වූ අතර, වී කෙටීමේ සංකීර්ණ හතක් ඉදි කිරීමත් සමග ගබඩා කිරීමේ අතිරේක පහසුකම් තවත් ටොන් 27,700 කින් වැඩි වනු ඇත.

මිල දී ගනු ලබන වී කෙටීම එම මණ්ඩලයට මුහුණ පෑමට සිදු වූ ප්‍රධාන ප්‍රශ්නයකි. මීට විසඳුමක් වශයෙන් පෞද්ගලික වී මෝල් පිහිටුවීමට බලාපොරොත්තු වන අය සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය හා වාණිජ බැංකු ද මගින් රුපියල් 3,00,000 දක්වා ණය පහසුකම් ද, වී මෝල් නවීකරණය සඳහා රුපියල් 1,00,000 දක්වා ණය පහසුකම් දසලසා දි ඇත.

මේ අතර, 1980 මාර්තු වේදි වී අලෙවි මණ්ඩලය මගින් ආහාර දෙපාර්තමේන්තුව වෙත සපයන ලද හාල් ප්‍රමාණය ටොන් 10,790 කි. මීට අමතරව, දෙපාර්තමේන්තුව මගින් පිටරටින්ද හාල් ටොන් 28,277 ක් ආනයනය කර ඇත. ආහාර මුද්දර ක්‍රමය නිසාත්, හාල් අලෙවිය සඳහා නිදහස් වෙළෙඳ පොළක් බිහිවීම නිසාත් ආහාර දෙපාර්තමේන්තුවට අවශ්‍යවන හාල් ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් දැන් පහතවැටී තිබේ.

(සියළු ම සංඛ්‍යා බුසල් වලිනි.)

| (වකවානුව) | 1976 | 1977 | 1978 | 1979 |
|---|---|---|---|---|
| ජන. වාරි – දෙසැම්බර් | 1,28,75,500 | 2,45,55200 | 3,23,47,100 | 2,57,95,900 |
| වාර්ෂික නිෂ්පාදිතය | 6,00,34,000 | 8,03,87,000 | 9,06,05,000 | 9,18,86,000 |

(මහ බැංකු විවරණිකාවෙනි)

★ ★ ★ ★

# ලොරි – ට්‍රැක්ටර් – වෑන් හිඟය මගහැරේ

ගොවි ද්‍රව්‍ය ප්‍රවාහන කටයුතුවලට කලක පටන් විශාල බාධකයක් හැටියට තිබුණේ ලොරි, වෑන් හා ට්‍රැක්ටර් හිඟය යි. දැන් එම වාහන හිඟය සහමුලින් ම වාගේ මගහැරී ගොසිනි.

පසුගිය වසර තුළ පටණක් ලොරි හා වෑන් රථ 6,500 ක් පමණ අලුතෙන් ලියා පදිංචි කර ඇති බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවල දැක්වේ. 1977 දී ලොරි හා වෑන් රථ 1,006 ක් ද, 1978 දී 4876 ක් ද, අලුතෙන් ලියා පදිංචි කර ඇත.

මේ අතර, 1977 සිට මේ දක්වා මෙරටට ගෙන්වා ඇති ට්‍රැක්ටර් සංඛ්‍යාව 12,000 කට අධිකය.